(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක **45**. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2022 ජූලි 16 සෙනසුරාදා පූ.භා. 10.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** වැඩබලන ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **ටිරාන් අලස් මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **නසීර් අහමඩ් මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **මනුෂ නානායක්කාර මහතා,** කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **නලින් ප්‍රනාන්දු මහතා,** වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා

ගරු **හරීන් ප්‍රනාන්දු මහතා,** සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රොෂාන් රණසිංහ මහතා,** වාරිමාර්ග අමාත්‍යතුමා සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** සෞඛ්‍ය අමාත්‍යතුමා සහ ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

---

ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා

ගරු ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා

ගරු තලතා අතුකෝරල මහත්මිය

ගරු සම්පත් අතුකෝරල මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු අශෝක් අබේසිංහ මහතා

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු මායාදුන්න චින්තක අමල් මහතා

ගරු ලසන්ත අලගියවන්න මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු (ආචාර්ය)(මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු අකිල එල්ලාවල මහතා

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු සාගර කාරියවසම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු උදය ගම්මන්පිල මහතා
ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
ගරු උදයකාන්ත ගුණතිලක මහතා
ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය
ගරු යදාමිණී ගුණවර්ධන මහතා
ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා
ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා
ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා
ගරු සිසිර ජයකොඩි මහතා
ගරු මිලාන් ජයතිලක මහතා
ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
ගරු අනුරාධ ජයරත්න මහතා
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා
ගරු දයාසිරි ජයසේකර මහතා
ගරු එම්. එස්. තවුෆික් මහතා
ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා
ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
ගරු ජීවන් තොන්ඩමන් මහතා
ගරු චාමර සම්පත් දසනායක මහතා
ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා
ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා
ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා
ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
ගරු අනුර දිසානායක මහතා
ගරු දුමින්ද දිසානායක මහතා
ගරු එස්. බී. දිසානායක මහතා
ගරු මංජුලා දිසානායක මහත්මිය
ගරු මයන්ත දිසානායක මහතා
ගරු රෝහණ දිසානායක මහතා
ගරු සාරතී දුෂ්මන්ත මහතා
ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා
ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා
ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා
ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා
ගරු අසංක නවරත්න මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු සනත් නිශාන්ත මහතා
ගරු කිංස් නෙල්සන් මහතා
ගරු බුද්ධික පතිරණ මහතා
ගරු අනුප පස්කුවල් මහතා
ගරු ඩිලාන් පෙරේරා මහතා
ගරු නිරෝෂන් පෙරේරා මහතා
ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා
ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
ගරු අශෝක ප්‍රියන්ත මහතා
ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය
ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා
ගරු උද්දික ප්‍රේමරත්න මහතා
ගරු රෝහණ බංඩාර මහතා
ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු රිසාඩ් බදියුදීන් මහතා
ගරු තාරක බාලසූරිය මහතා
ගරු විජිත බේරුගොඩ මහතා
ගරු සුදත් මංජුල මහතා
ගරු එස්. එම්. මරික්කාර් මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු ඉම්රාන් මහරූෆ් මහතා
ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා
ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා
ගරු මොහමඩ් මුසම්මිල් මහතා
ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා
ගරු පාඨලී චම්පික රණවක මහතා
ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
ගරු සී. බී. රත්නායක මහතා
ගරු ලොහාන් රත්වත්තේ මහතා
ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
ගරු හර්ෂණ රාජකරුණා මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා
ගරු නාමල් රාජපක්ෂ මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා
ගරු එම්. රාමේෂ්වරන් මහතා
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
ගරු නිමල් ලාන්සා මහතා
ගරු වරුණ ලියනගේ මහතා
ගරු ගාමිණී ලොකුගේ මහතා
ගරු ජානක වක්කුඹුර මහතා
ගරු ගාමිණී වලේබොඩ මහතා
ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
ගරු සී. වී. විග්නේෂ්වරන් මහතා
ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
ගරු චමින්ද විජේසිරි මහතා
ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා
ගරු මධුර විතානගේ මහතා
ගරු හේෂා විතානගේ මහතා
ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
ගරු තේනුක විදානගමගේ මහතා
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු විමල් වීරවංශ මහතා
ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා
ගරු වීරසුමන වීරසිංහ මහතා
ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා
ගරු දිලිප් වෙදආරච්චි මහතා
ගරු එම්. යූ. එම්. අලි සබ්රි මහතා
ගරු ජගත් සමරවික්‍රම මහතා
ගරු ජයන්ත සමරවීර මහතා
ගරු රංජිත් සියඹලාපිටිය මහතා
ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා
ගරු වඩිවේල් සුරේෂ් මහතා

**ගරු  ජෝන් සෙනෙවිරත්න මහතා**

**ගරු  (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු  රවුෆ් හකීම් මහතා**

**ගරු  එච්. එම්. එම්. හරීස් මහතා**

**ගරු  අබ්දුල් හලීම් මහතා**

**ගරු  කබීර් හෂීම් මහතා**

**ගරු  ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු  (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු  ජයරත්න හේරත් මහතා**

**ගරු  ඩී. බී. හේරත් මහතා**

**ගරු  විජිත හේරත් මහතා**

**ගරු  සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු  ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ නිවේදනය අනුව පාර්ලිමේන්තුව රැස්විය.**

**කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"ගරු මන්ත්‍රීවරුනි, අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 38(1)(ආ) ව්‍යවස්ථාව ප්‍රකාරව, 2022 ජූලි 14 දින සිට බලපැවැත්වෙන පරිදි ජනාධිපති ධූරයෙන් ඉල්ලා අස් වී ඇති බැවින් ඒ පිළිබඳ මතු පළවන නිවේදන පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් දැන් මෙම සභාවට ඉදිරිපත් කරනු ලැබේ."

ඒ අනුව මහ ලේකම්වරයා විසින් මතු පළවන නිවේදන සිදු කරන ලදී:—

I

"ගරු මන්ත්‍රීවරුනි, 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව, පාර්ලිමේන්තුව විසුරුවා හැර නොමැති අවස්ථාවක, ජනාධිපති ධූරයේ පුරප්පාඩුවක් ඇති වූ විට, ඒ පුරප්පාඩුව ඇති වී දින තුනක් ඇතුළත රැස්වීම සඳහා පාර්ලිමේන්තුව කැඳවීමක් සේ ක්‍රියාත්මක විය යුතු බැවින් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වශයෙන් ඔබතුමන්ලාහට දැනුම්දීම පිණිස මා විසින් නිකුත් කරන ලද අති විශේෂ ගැසට් නිවේදනය මෙම ගරු සභාවට ප්‍රථමයෙන්ම කියවනු කැමැත්තෙමි."

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2288/27 - 2022 ජූලි මස 15 වැනි සිකුරාදා - 2022.07.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් කරනු ලබන නිවේදනය**

1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත

**4 වන වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැනුම්දීම**

2022 ජූලි 16 වැනි සෙනසුරාදා පූර්ව භාග 10.00ට

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ රැස්වීමක් කැඳවීම**

1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසුරුවා හැර නොමැති අවස්ථාවක, ජනාධිපති ධූරයේ පුරප්පාඩුවක් ඇති වූ විට, ඒ පුරප්පාඩුව ඇතිවී දින තුනක් ඇතුළත රැස්වීම සඳහා පාර්ලිමේන්තුව කැඳවීමක් සේ ක්‍රියාත්මක විය යුතු බැවින් 2022 ජූලි මස 16 වැනි සෙනසුරාදා පූර්ව භාග 10.00ට පාර්ලිමේන්තුව රැස්වන බව පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ධම්මික දසනායක වන මම පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන්හට දැනුම් දෙන බව මෙයින් නිවේදනය කරමි.

ධම්මික දසනායක,
පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

2022 ජූලි මස 15 වැනි සිකුරාදා,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ දී ය.

EOG 07 - 0072

1A - G 37077 — 366 (2022/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

II

"ගරු මන්ත්‍රීවරුනි, අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා 2022 ජූලි 14 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්වීම හේතු කොට ගෙන ජනාධිපති ධූරයේ පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 5 වැනි වගන්තිය ප්‍රකාරව, මා විසින් පාර්ලිමේන්තුවට මෙසේ දන්වා සිටිනු ලබන අතරම ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 38(1)(ආ) ව්‍යවස්ථාව ප්‍රකාරව, අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් ජනාධිපති ධූරයෙන් ඉල්ලා අස්වීම දන්වමින් ගරු කථානායකතුමා වෙත එවන ලද 2022 ජූලි 14 දිනැති ලිපිය දැන් මෙම ගරු සභාවට කියවනු කැමැත්තෙමි."

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

2022 ජූලි මස 14 වන දින

ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි

**ජනාධිපති ධුරයෙන් ඉල්ලා අස්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හත්වන විධායක ජනාධිපතිවරයා වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව ප්‍රතිඥාවන් දී 2019 නොවැම්බර් මස 18 වන දින මා විසින් එම ධුරයේ රාජකාරි භාරගන්නා ලදී.

ජනාධිපති ධුරයේ රාජකාරි ආරම්භ කර මාස තුනක් ගතවීමටත් පෙර මුළු මහත් ලෝකයටම බලපෑ කොවිඩ් - 19 මාරාන්තික වසංගත තත්ත්වයට මුහුණ දීමට අප රටට ද සිදුවූ අතර, ඒවන විටත් ශ්‍රී ලංකාවේ පැවති ආර්ථික අර්බුදය හමුවේ වුවද, එකී වසංගත තත්ත්වයෙන් ජනතාව ආරක්ෂා කරගැනීමට මා හට හැකිවීම සතුටට කරුණකි.

එමෙන්ම, කොවිඩ් - 19 වසංගත තත්වයෙන් ජනතාව ආරක්ෂා කර ගැනීමට 2020 සහ 2021 වර්ෂ වල වරින්වර රට වසා දැමීමට සිදුවීම හේතුවෙන් වසර ගණනාවක් තිස්සේ වර්ධනය වෙමින් පැවති ආර්ථික අර්බුදය තවදුරටත් වර්ධනය වීම සහ විදේශ විනිමය හිඟයකට මුහුණ දීමට අප රජයට සිදු විය.

ඒ තුළින් ඇතිවූ අස්ථාවරත්වයන්ට විසඳුම් සෙවීම සඳහා පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම දේශපාලන පක්ෂ නායකයින්ට ආරාධනා කරමින් සර්ව පාක්ෂික හෝ ජාතික ආණ්ඩුවක් පිහිටුවීමට මවිසින් හැකි සෑම උත්සාහයක්ම ගන්නා ලද අතර ඒ සඳහා ගතහැකිව තිබූ හොඳම පියවරයන් ගන්නා ලද බව මාගේ පෞද්ගලික විශ්වාසය වේ.

පොදු ජනතාවගේ ඉල්ලීම සහ 2022 ජූලි මස 09 දිනැති ලිපිය මගින් ඔබතුමා විසින් මා වෙත දැනුම් දුන් පාර්ලිමේන්තුවේ පක්ෂ නායකයින්ගේ ඉල්ලීම අනුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 38 (1) (ආ) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධුරයෙන් 2022 ජූලි මස 14 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්වන බව මෙයින් දැනුම් දෙමි. ඒ අනුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඉදිරි පියවර ගන්නා ලෙසත් ඔබතුමාගෙන් ඉල්ලා සිටිමි.

තවද, මේ දක්වා මා උපත් මව්බිමට මාගේ උපරිම ශක්ති ප්‍රමාණයෙන් සේවය කල පරිදිම ඉදිරියටත් ඒ සඳහා මාගේ උපරිම දායකත්වය ලබා දීමට ඇප කැපවී සිටින බව වැඩිදුරටත් දන්වා සිටිමි.

මෙයට - හිතවත්

ගෝඨාභය රාජපක්ෂ
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති

III

"ගරු මන්ත්‍රීවරුනි, 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 5 වැනි වගන්තිය ප්‍රකාරව, අද දින රැස්වීමේ සිට පැය හතළිස් අටකට කලින් නොවන්නා වූ සහ දින හතකට පසු නොවන්නා වූ දිනයක මා විසින් නාම යෝජනා භාරගනු ලබන දිනයක් සහ වේලාවක් නියම කළ යුතු බැවින් එකී දිනය සහ වේලාව වශයෙන් 2022 ජූලි මස 19 වැනි අඟහරුවාදා පූ.භා 10.00 ට පාර්ලිමේන්තුව රැස්වී නාම යෝජනා භාරගැනීමේ කාර්යයේ නිරත විය යුතු බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි."

IV

"ගරු මන්ත්‍රීවරුනී, අවසාන වශයෙන් ඔබතුමන්ලාගේ පහසුව පිණිස අදාළ පනතේ 6 වැනි වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව නාම යෝජනා භාර ගැනීම සම්බන්ධයෙන් මෙම කරුණු ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි:—

පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා තේරීම් භාර නිලධාරියා වශයෙන් ක්‍රියා කරනු ලබන බව දන්වා සිටිමි.

පුරප්පාඩු වී තිබෙන ජනාධිපති ධුරය සඳහා තෝරා පත්කර ගනු ලැබීමට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු යෝජනා කිරීමට අදහස් කරන සෑම මන්ත්‍රීවරයකුම එසේ යෝජනා කිරීමට අපේක්ෂා කරනු ලබන මන්ත්‍රීවරයා එසේ තෝරා පත්කර ගනු ලැබුවහොත්, ජනාධිපති ධුරයෙහි සේවය කිරීමට එතුමා කැමති බවට ලිඛිත එකඟත්වය කලින් ලබාගත යුතු අතර එහි පිටපතක් නාම යෝජනා භාරගනු ලබන 2022 ජූලි 19 වැනි අඟහරුවාදා මා වෙත භාරදෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

නාම යෝජනා භාරගන්නා දිනයේදී, නාම යෝජනා කිරීමට අපේක්ෂා කරනු ලබන මන්ත්‍රීවරයා අනිවාර්යයෙන්ම එදින සභාගර්භය තුළට පැමිණ සිටිය යුතු අතරම ඒ යෝජනාව වෙනත් මන්ත්‍රීවරයකු විසින් ස්ථිර කරනු ලැබිය යුතුය.  ඒ සම්බන්ධයෙන් විවාද කිරීමට අවසර නොමැති බව සඳහන් කරනු කැමැත්තෙමි.

එක් මන්ත්‍රීවරයකුගේ නමක් පමණක් 2022 ජූලි 19 වැනි අඟහරුවාදා යෝජනා කර, ස්ථිර කරනු ලැබුවහොත් එසේ යෝජනා කරනු ලැබූ මන්ත්‍රීවරයා පුරප්පාඩු වී තිබෙන ජනාධිපති ධුරය සඳහා පාර්ලිමේන්තුව විසින් තෝරා පත්කරනු ලැබ තිබෙන බව මා විසින් ප්‍රකාශයට පත්කරනු ඇත.

කෙසේ වෙතත්, 2022 ජූලි 19 වැනි අඟහරුවාදා එක් මන්ත්‍රීවරයකුට වඩා වැඩි දෙනෙකුගේ නම් යෝජනා කරනු ලැබ ස්ථිර කරනු ලබයි නම් 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන ප්‍රකාරව නාම යෝජනා භාර ගැනීමේ වේලාවෙන් පැය 48 කට පසුව නොවූ දිනයක ඡන්ද විමසීම සිදු කරනු ලබන අතර එකී දිනය හා වේලාව පාර්ලිමේන්තුව විසින් නියම කරනු ලැබිය යුතුය.

ඒ අනුව, දැනට අදහස් කර ඇති පරිදි පාර්ලිමේන්තුව විසින් නියම කරනු ලබන 2022 ජූලි 20 වැනි බදාදා පාර්ලිමේන්තු රැස්වීමක් පවත්වා ජනාධිපති ධුරය සඳහා ඡන්ද විමසීම සිදුකළ හැකිය.

එලෙසම ගරු මන්ත්‍රීවරුනි, පුරප්පාඩු වී තිබෙන ජනාධිපති ධුරය සඳහා යම් මන්ත්‍රීවරයකුගේ නම යෝජනා කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 92 ව්‍යවස්ථාවේ ජනාධිපතිවරයකු වශයෙන් තෝරා පත්කර ගැනීමට දක්වා ඇති නුසුදුසුකම් පිළිබඳව සැලකිලිමත් වීම අත්‍යවශ්‍ය බව දන්වා සිටීමට කැමැත්තෙමි.”

**2. කල් තැබීම:** “මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය”යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; පූ.භා. 10.13 ට කථානායකවරයා විසින් අද දින සභා සම්මතිය අනුව, 2022 ජූලි 19 අඟහරුවාදා පූ. භා. 10.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් තබන ලදී.